www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 8 – Second Term Test –July 2019
දෙවන වාර පරීක්ෂණය - 2019 ජූලි - 8 ශ්‍රේණිය

කාලය : පැය 2
Time :2hours

## Sinhala Language and Literature – I
සිංහල භාෂාව හා සාහිත්‍යය – I

Name :- ............................................ Grade : -................ Index number:-...................

❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I කොටස

➢ ඉරි ඇඳි පදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ''මේ දෙන්නා හරියට ජාඩියට මූඩිය වාගේ '' යැයි ගුරුතුමා සිසුන් දෙදෙනාගේ හැසිරීම දැක පැවසුවේ ය.

   (1) එකට එක කිරීම (2) හොඳින් ගැළපීම
   (3) සතුරුව සිට මිතුරු වීම (4) දෙදෙනා එකම වයසේ වීම

2. ''අපේ දූන් පොරකටු ගෙවිලා'' යැයි කියමින් වලව්වේ හාමු ඉස්තෝප්පුවට ගියේ ය.

   (1) මිල මුදල් අවසන් වී (2) වයසට ගිහිල්ලා
   (3) ලෙඩ දුක් ඇති වී (4) බලය පිරිහී ගොස්

3. මුදලාලි මහත්තයා හාමිනේ අමතමින් ''අනේ කාලේ වනේ වාසේ කියන්නා වගේ එකා යකා වෙලා. මේවට දැන් අඬා දොඩා වැඩක් නෑ'' යැයි පැවසුවේ ය.

   ඉහත ඉරි ඇඳි සාම්ප්‍රදායික යෙදුම් පිළිවෙළින් නම් කළ විට ඒවා අයත් වන්නේ,

   (1) යුගල පද, ප්‍රස්තාව පිරුළු හා ඉඟි වැකි ගණයට ය
   (2) ඉඟි වැකි, ප්‍රස්තාව පිරුළු හා යුගල පද ගණයට ය
   (3) ප්‍රස්තාව පිරුළු. ඉඟි වැකි හා යුගල පද ගණයට ය
   (4) ඉඟි වැකි, යුගල පද හා ප්‍රස්තාව පිරුළු ගණයට ය

4. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන ඇති වරණය තෝරන්න.

   (1) මර්දනය, ප්‍රතිඵල, ලේඛකයා
   (2) මර්ධනය, ප්‍රතිඵල, ලේඛකයා
   (3) මර්දනය, ප්‍රතිඵල, ලේකඛයා
   (4) මර්දනය, ප්‍රථිඵල, ලේඛකයා



agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

5. ශබ්ද කෝෂ භාවිතයෙන් ගත හැකි ප්‍රයෝජනයක් නොවන්නේ,
   (1) අක්ෂර වින්‍යාසය නිවැරදි කර ගැනීමට හැකි වීම
   (2) එම පදය අඩංගු මූලික ග්‍රන්ථය දැනගත හැකි වීම
   (3) පදයක අර්ථය අවබෝධ කර ගැනීමට හැකි වීම
   (4) පදයක ව්‍යාකරණ ලක්ෂණ දැන ගත හැකි වීම

6. අකාරාදී පිළිවෙළ අනුව පෙළ ගස්වා ඇති වචන කාණ්ඩය වන්නේ,
   (1) පතෝල, පත්තක්කා, පපඩම්, පරිප්පු
   (2) පපඩම්, පතෝල, පත්තක්කා, පරිප්පු
   (3) පපඩම්, පරිප්පු, පත්තක්කා, පතෝල
   (4) පත්තක්කා, පතෝල, පපඩම්, පරිප්පු

7. " අහසේ තරු වැල් පිරිලා
   පොළොවේ සුදු මල් පිපිලා
   මඟුල් ගෙවල් දෙකක් වගෙයි
   මේ දෙපළම හැඩ ගැහිලා "

   ඉහත කවි පද කොටස ඇතුළත් කාව්‍ය නිර්මාණය රචනා කරන ලද්දේ,
   (1) කුමාරතුංග මුනිදාස මහතා ය
   (2) ගරු මර්සලීන් ජයකොඩි පියතුමා ය
   (3) එස් මහින්ද හිමි ය
   (4) මහගමසේකර මහතා ය

8. එකිනෙකා සමඟ අදහස් හුවමාරුවේ දුර්වලතා කියැවෙන ප්‍රස්තාව පිරුළකට උදාහරණයක් නොවන්නේ,
   (1) බතල කන්න පොල් තේරුවා වගේ
   (2) කළුවා මාරපන් ගියා වගේ
   (3) හතර බීරි කතාව වගෙයි
   (4) දොම්පෙට යන පාර ඇහුවා වගේ

9. විධි ක්‍රියාවක් ඇතුළත් නොවන පිළිතුර වන්නේ,
   (1) කරව පියාසර සකි කොන්ත ගං තොටින්
   (2) බලාපල්ලා මේ මූණේ හැටි
   (3) ගොඩැල්ලේ තරම දැන ගෙන ළිඳ කපනු
   (4) ගව්වෙන් ගව්ව දිව මාලිගා සෑදේවා

10. සංවාද පැවැත්වීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ,
   (1) තමාගේ අදහස් මුලින්ම ප්‍රකාශ කිරීම
   (2) පුද්ගලයාගේ තරාතිරම අනුව මුලින්ම අවස්ථාව ලබා දීම
   (3) නොගැළපෙන අදහස් ඇත්නම් වරින් වර ප්‍රශ්න නැගීම
   (4) ආචාරශීලීව කතා බහේ යෙදීම



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

11. ආශිර්වාද ක්‍රියා පදයක් යෙදී ඇති පිළිතුර වන්නේ,
    (1) ජයවර්ධන පුරවර දනු මිතුරුතුමා
    (2) ගනු අවසර ඒ නිරිඳු සිරි පතුල් වැඳ
    (3) වනාන්තරේ වන සපුමල් පිපියන්
    (4) බල සුබ නිමිති පෙරමග නැකතටත් වැඩී

12. කුමන වර්ගයේ ප්‍රායෝගික ලේඛනයක වුවද තිබිය යුතු පොදු ලක්ෂණයක් වන්නේ,
    (1) නිරවුල් අදහස් ප්‍රකාශනය
    (2) සුපුරුදු අත්සන යෙදීම
    (3) විරාම ලක්ෂණ පිළිබඳ සැලිකිලමත් නොවීම
    (4) ලබන්නාගේ ලිපිනය සඳහන් කිරීම

13. "අවුරුදු සිහිනය" කෙටිකතාව අයත් කෙටිකතා සංග්‍රහය සහ එහි කතුවරයා වන්නේ,
    (1) ආවර්ජනා, මහගමසේකර මහතා
    (2) ආවර්ජනා, ගුණදාස අමරසේකර මහතා
    (3) රතු රෝසමල, මහගම සේකර මහතා
    (4) රතු රෝසමල, ගුණදාස අමරසේකර මහතා

14. හාන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන් මහතා ලියූ කතාවක් නොවන්නේ,
    (1) පුංචි පැංචි (2) අවලස්සන තාරාවා
    (3) පුංචි දියකිඳුරිය (4) හිම රැජින

15. " දක්ෂ, තරුණ, මහලු, මෝඩ " යන නාම පද අයත් වන්නේ,
    (1) ජාති නාම ගණයට ය (2) සංඥා නාම ගණයට ය
    (3) ගුණ නාම ගණයට ය (4) ද්‍රව්‍ය නාම ගණයට ය

16. සමාස නාමවලට අයත් නොවන පදයක් වන්නේ.
    (1) කිරිබත් (2) රන්මුවා (3) පන්සිල් (4) ගස්වැල්

17. ක්‍රියා විශේෂණ පදයක් යෙදී නොමැති වැකිය වන්නේ,
    (1) රියදුරා රථය වේගයෙන් පැදෙව්වේ ය.
    (2) එළදෙන ඇගේ පැටියා සොයා හයියෙන් කෑගැසුවා ය.
    (3) කරත්තකරු ගොනාට වැරෙන් පහරක් ගැසුවේ ය.
    (4) අත්තම්මා දර දමා ළිප මෙලෙව්වා ය.

18. "තුරු" යන බහුවචන පදයට සමාන අර්ථයක් දෙන පදයක් නොවන්නේ,
    (1) තරු (2) ගස් (3) තුර්ය (4) උතුරු



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

19. ව්‍යාකරණානුකූලව ලියා ඇති වාක්‍යය තෝරන්න.
    (1) ගංගාවෝ මුහුදට ගලා බසියි.
    (2) ගෙවල් රාශියක් ගංවතුරට යට වූවෝ ය.
    (3) සිසිල් දිය ඇලි ගලා බසිති.
    (4) විදුහල්පතිතුමා සිසුන්ට අවවාද දුන්නේ ය.

20. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය වැරදියට ලියා ඇති වාක්‍යය තෝරන්න.
    (1) තොපි මුහුදු වෙරළ දෙසට ගියෙහි.
    (2) නුඹ ගුවන් යානයෙන් බැස්සෙහි.
    (3) ගස්හු සුළඟට සෙලවෙති.
    (4) ධීවරයෝ රැය පහන් වන තුරුම මසුන් ඇල්ලුවෝ ය.

agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 8 – Second Term Test – July 2019
දෙවන වාර පරීක්ෂණය - 2019 ජූලි - 8 ශ්‍රේණිය

කාලය : පැය 2
Time :2 hours

## Sinhala Language and Literature – II
සිංහල භාෂාව හා සාහිත්‍යය – II

Name :- .................................................. Grade : -............... Index number:-...................

### II කොටස

❖ පළමු හා දෙවන ප්‍රශ්න අනිවාර්යය වේ. ඉතිරි ප්‍රශ්නවලින් තුනකට පමණක් පිළිතුරු ලියන්න. සියලුම ප්‍රශ්න පහකි.

❖ ඔබේ පන්තියේ සිංහල භාෂාව හා සාහිත්‍යය උගන්වන ගුරුභවතා පන්තියේ සිසුන් අතර කියවීමේ තරගයක් පවත්වන්නට ඇත. එම තරගය ආශ්‍රය කරගෙන පහත දක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) එහිදී ඔබ ඉගෙනගත් පරිදි කියවීමේ මූලික ප්‍රභේද දෙක මොනවා ද?

(ii) එම කියවීමේ තරගය සඳහා යොදා ගන්නා ලද නාට්‍යය කොටස සහ ශ්ලෝක උපුටා ගන්නා ලද මුල් කෘති දෙක සඳහන් කරන්න.

(iii) 8 ශ්‍රේණිය පෙළ පොතෙහි සඳහන් "දීඝායු කුමාරයාගේ වත" යන කතාව කියවන ලද්දේ කුමන ශෛලියෙන් ද?

(iv) ඔබ ඉගෙන ගත් පරිදි ශ්ලෝක වලින් යහපත් ප්‍රතිඵල ලැබීමට ඒවා කියවීමේ දී සැලකිලිමත් විය යුතු ප්‍රධාන කරුණ කුමක් ද?

(v) ගුරුතුමා පෙන්වා දුන් පරිදි කියවීමේදී සැකිලිමත් විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

(vi) නොයෙක් පොත පත කියවීමෙන් ඔබට ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න.

(vii) මෙම තරගය පැවැත්වීමේ දී සිසුන් මුහුණ දුන් ගැටලු දෙකක් සඳහන් කරන්න.

(viii) මෙම කියවීමේ තරගයට සහභාගී වීමෙන් ඔබ ලද ප්‍රයෝජන 2ක් ලියන්න.

(ලකුණු 2X8 =16)

(2) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150 කට නො අඩු රචනයක් ලියන්න.

(i) පොලිතින් රකුසාගෙන් පරිසරය බේරා ගනිමු.

(ii) අසිරිමත් මුහුදු වෙරළ

(iii) මා කියවූ හොඳම කෙටිකතාව

(iv) කියවීම මිනිසා සම්පූර්ණ කරයි.



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

(v) ''වැසි වසිනා අහස අපි
මුතු බඳිනා මුහුද අපි
මිණි දිලෙනා පොළොව අපි
සිරි ලංකා රටම අපි''

''රටගොඩනගන උදාර කම්කරුවෝ අපි වෙමු.''

(ලකුණු 14)

(3) ඔබ පාසලේ දිනපතා එකතුවන කැලි කසළ නිසි වේලාවට රැගෙන නොයෑම නිසා ඇති වී තිබෙන පරිසර දූෂණය පිළිබඳව දන්වා කැලි කසළ නිසි වේලාවට රැගෙන යෑමට වැඩ පිළිවෙළක් යොදන මෙන් දන්වමින් විදුහල්පතිතුමා විසින් කොළඹ මහ නගර සභාවේ නගරාධිපතිතුමාට යැවීමට සුදුසු රාජකාරී ලිපියක් ලියන්න.

හෝ

ඔබ පාසලේ නව නිපැයුම්කරුවන්ගේ සංගමය විසින් පැවැත්වීමට සූදානම් වන ''සහසක් නිපැයුම් 2019'' ප්‍රදර්ශනය පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා දැන්වීම් පත්‍රිකාවක් නිර්මාණය කරන්න.

(4) පහත දී වගුව නිවැරදි පිළිතුරු යොදා සම්පූර්ණ කරන්න.

| | කවි පද කොටස | රචකයා |
|---|---|---|
| (i) | ''ගල්වා හිසෙහි තෙල් යහමින්<br>එල්ලා කරෙහි පංචායුධය.....'' | |
| (ii) | ''වෙන වෙන හොඳ පාට ඇඳුම්<br>ඇඳගත් පොඩි ළමයි පෙළක්.....'' | |
| (iii) | ''ඉලපත ගෙන ඇය ගෙය අතුගාන විට<br>ලෝකෙම ලස්සන ආවා වගෙයි ගෙට.....'' | |
| (iv) | ''පොහොසත් අයගේ මුදල් දෙතොත්<br>ගරු නාමත් පදවිත් පතා ගෙනයි.....'' | |
| (v) | ''සුදෝ සුදුවැ වලාකුළෙනි<br>ඇයි මේ සිල් ගත්තා වැනි.....'' | |

(ලකුණු 10)



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

(5) දී ඇති ගීතය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සූවිසි වරමින් දෙව් රැක වරණින්
අරුණ උදාවේවා
සම්බුදු සුවඳින් මිහිමඬල වැසී
නිවී පහන් වේවා
දිනේවා මව් බිම ශ්‍රී ලංකා
ලෝ සතුන් නිතින අතිනතින් වෙලී
හදවතින් බැඳීයේවා
දෙව් බඹුන් ලෙසින අගතියෙන් මිදී
නෙක ඉසුරු උදාවේවා
දිනේවා මව් බිම ශ්‍රී ලංකා

සත් ගුණෙන් පෙගී මෙත් හැඟුම් පිරී
නව ලොවක් උදාවේවා
උපතුපන් හවේ හදවතින් බැඳී
මේ බිමේ ජනිත වේවා
දිනේවා මව් බිම ශ්‍රී ලංකා

පද රචනය - කුමාරදාස සපුතන්ත්‍රී
ගායනය - සුනිල් එදිරිසිංහ

(i) මෙම ගීතය කුමන ගීත ගණයට අයත් ද?

(ii) මෙහි ඇති ආශිර්වාද ක්‍රියා දෙකක් ලියන්න.

(iii) ලෝකයේ වෙසෙන සියලු මිනිසුන් සමගියෙන් බැඳී ජීවත් වේවා... යන අදහස කියවෙන ගී පද කොටස උපුටා දක්වන්න.

(iv) මෙම ගීතයට අනුව ඔහුගේ අවසන් බලාපොරොත්තුව කුමක් ද?

(v) පහත පද සඳහා සමාන පද ගීතයෙන් උපුටා දක්වන්න.

1. දෙරණ -
2. යහපත් -
3. ඉපදේවා -
4. හිරු උදාවේවා -

(ලකුණු 10)



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

(6) පහත දක්වා ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වායුගෝලයේ කැලඹිලි තත්ත්වයන් ඇති කරමින් වේගයෙන් සුළං හමන විට එය සුළි සුළඟක්, කුණාටුවක් හෝ චණ්ඩ මාරුතයක් යන විවිධ නම්වලින් හැඳින්වේ.

වායුගෝලයේ කිසියම් ප්‍රදේශයක ඇති වාතය රත් වී ඉහළ නගින විට එය තිබූ තැන්හි වායු පීඩනය අඩු වේ. එවිට ශීතල ප්‍රදේශයක ඇති වාතය එම අඩුව පිරවීමට වැඩි පීඩනයක් ඇතිව වේගයෙන් හමා එයි. වාතයේ වේගය නිසා එය සුළියක ස්වභාවයක් ගනී. වාතය ඉහළ නැගි ස්ථානයේ පුනීලයක හැඩයක් ගත් දූවිලි වලාකුළක් ඇති වේ. එම පුනීලය තුළ ඇත්තේ අඩු පීඩනයක් බැවින් එයට හමුවන බොහෝ දේ ඇද උදුරා ගැනේ. මෙවන් සුළඟක වේගය අධික ය. නිවර්තන ප්‍රදේශවල නිතර හටගන්නා ''හරිකේන්'' නම් සුළං කුණාටු විශේෂයක් ඇත. එහි වේගය පැයට කිලෝමීටර 120 - 200 ක් පමණ වේ. සුළි සුළඟකින් සිදුවන විනාශය අති විශාල ය.

(i) ඉහත ඡේදයට ගැළපෙන මාතෘකාවක් ලියන්න.

(ii) ඡේදයට අනුව සුළි සුළඟක් යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(iii) ශීතල ප්‍රදේශයක ඇති වාතය අඩු පීඩනයක් සහිත ප්‍රදේශයකට හමා යෑමේ දී එය සුළියක ස්වභාවයක් ගන්නේ කුමන හේතුවක් නිසා ද?

(iv) සුළි සුළඟක් හඳුන්වන තවත් නම් දෙකක් ලියන්න.

(v) අ) ''හරිකේන්'' යනු කුමන ප්‍රදේශවල හටගන්නා සුළි කුණාටු විශේෂයක් ද?

ආ) මෙම ඡේදයේ ඇති සඤ්ඤක අක්ෂර සහිත වචන දෙකක් ලියන්න.

(ලකුණු 10)

(7) පහත දී ඇති ප්‍රකාශ ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ''නෑ නෑ එසේ කරන්න එපා. ඇය පුළුවන් තරම් කාලයක් අගේ මෙහෙය ඉටු කළා''

අ) ඉහත ප්‍රකාශය උපුටා ගන්නා ලද පාඩමේ නම කුමක් ද?

ආ) මෙම ප්‍රකාශය කළේ කවුද?

ඇ) එය ප්‍රකාශ කරන ලද්දේ කාට ද?

(ii) ''මේකේ හැඩේ දිගටියටත් තියනවා. රවුමටත් තියෙනවා.''

අ) මෙම කියමන උපුටා ගන්නා ලද පාඩම කුමක් ද?

ආ) එය ප්‍රකාශ කරන ලද්දේ කවුද?

ඇ) මෙය ප්‍රකාශ කරන ලද්දේ කාට ද?

(iii) ''ඔව් කියන්න කොහොම හරි මාව එක්ක යන්න එන්නයි කියලා හෙට උදෙන්ම''

අ) මෙම කියමන අඩංගු පාඩම කුමක් ද?

ආ) එහි මුල් කෘතියේ රචකයා කවුද?

ඇ) මෙය ප්‍රකාශ කරන ලද්දේ කවුද?

ඈ) මෙය ප්‍රකාශ කරන ලද්දේ කාට ද?

(ලකුණු 10)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!